# ආර්ථික විද්‍යාව

# Economics - MCQ

## ඉල්ලුම, සැපයුම, නම්‍යතාවය හා රජය වෙළෙඳපොළට මැදිහත්වීම

## පසුගිය වසර 08 ක බහුවරණ ප්‍රශ්න 2015 - 2022


**කුෂාන්**
වීරහැන්නැදිගේ
Masters in Economics,
BA Economics (special),
Executive Diploma in Human Resource Management,
Executive Diploma in Strategic Business Management,
Diploma in Marketing Management,
Advance certificate training and Human Resource development.


කුෂාන් වීරහැන්නැදිගේ

WhatsApp - 0768524299

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

8. කිසියම් පුද්ගලයෙක් ආදායම ඉහළ යන විට කිරි පිටි සඳහා කරන ඉල්ලුම වැඩි කරයි නම්, කිරි පිටි
(1) බාල භාණ්ඩයකට උදාහරණයක් වේ. (2) ආර්ථික නොවන භාණ්ඩයකට උදාහරණයක් වේ.
(3) ගිෆන් භාණ්ඩයකට උදාහරණයක් වේ. (4) පොදු භාණ්ඩයකට උදාහරණයක් වේ.
(5) සාමාන්‍ය භාණ්ඩයකට උදාහරණයක් වේ. (......)

9. යම් දෙන ලද අවස්ථාවක, තරගකාරී වෙළෙඳපොළක, 'සාමාන්‍ය භාණ්ඩයක්' සඳහා ඉල්ලුම වැඩි වී සැපයුම අඩු වූවහොත්,
(1) සමතුලිත මිල පහළ වැටෙන අතර සමතුලිත ප්‍රමාණය ඉහළ නගී.
(2) සමතුලිත මිලත් ප්‍රමාණයත් දෙක ම ඉහළ නගී.
(3) සමතුලිත ප්‍රමාණය ඉහළ නගී. සමතුලිත මිල ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.
(4) සමතුලිත මිල පහළ බසී. සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.
(5) සමතුලිත මිල ඉහළ නගී. සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන. (......)

**10.** බොහෝ පරිභෝජන කටයුතුවල දී සීනි සහ හකුරු එකිනෙකට ආදේශක වශයෙන් සැලැකේ. එබැවින් සීනි මිල ඉහළ ගියහොත්,

(1) හකුරු ඉල්ලුම වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.
(2) හකුරු ඉල්ලුම අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.
(3) හකුරු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.
(4) හකුරු මිල අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.
(5) හකුරු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. (……)

**11.** පොල් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය $-1.0$ ක් වේ යැයි සලකන්න. එම තත්ත්වය යටතේ පොල් ගෙඩියක මිල රු. 60ක් වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය පොල් ගෙඩි 500ක් වේ. ඉල්ලුම් කරනු ලබන පොල් ගෙඩි ප්‍රමාණය 600ක් වනුයේ පොල් ගෙඩියක මිල කොපමණ වන විට දී ද?

(1) රුපි. 30 (2) රුපි. 40 (3) රුපි. 50 (4) රුපි. 55 (5) රුපි. 60 (……)

12. කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට බලපානුයේ පහත සඳහන් කවර සාධකයක් ද?

(1) එම භාණ්ඩයේ මිල ඉහළ යාම
(2) එම භාණ්ඩයේ මිල පහළ වැටීම
(3) අනුපූරක භාණ්ඩයක මිල පහළ වැටීම
(4) ආදේශක භාණ්ඩයක මිල ඉහළ යාම
(5) අනාගත මිල පහළ වැටෙතියි යන අපේක්ෂාව (......)

13. පහළට බෑවුම් වන වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රයක් සහ ඉහළට බෑවුම් වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රයක් සහිත භාණ්ඩයක යෙදවුම් මිල පහළ වැටීමේ ප්‍රතිඵලයක් වනුයේ,

(1) සමතුලිත මිල හා ප්‍රමාණය ඉහළ යාම ය.
(2) සමතුලිත මිල හා ප්‍රමාණය පහළ යාම ය.
(3) සැපයුම් වක්‍රය වමට විතැන් වීම ය.
(4) සමතුලිත මිල පහළ වැටීම හා සමතුලිත ප්‍රමාණය ඉහළ යාම ය.
(5) සමතුලිත මිල ඉහළ යාම හා සමතුලිත ප්‍රමාණය පහළ යාම ය. (......)

**14.** කිසියම් කුඩා රටක සීනි සඳහා දේශීය වෙළෙඳපොළේ පවත්නා ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පිළිවෙළින් පහත සඳහන් සමීකරණ පෙන්නුම් කරයි.

$$Q_d = 320 - 3P \text{ (ඉල්ලුම)} \qquad Q_s = -80 + 2P \text{ (සැපයුම)}$$


තව ද එම රටේ සීනි වෙළෙඳපොළ ජාත්‍යන්තර වෙළෙඳාමට විවෘත බවත්, සීනි ඒකකයක ලෝක වෙළෙඳපොළ මිල රු. 60ක් වන බවත් සලකන්න. විදේශ වෙළෙඳාමට විවෘතව ඇති තත්ත්වය යටතේ, වෙළෙඳපොළට දේශීය වශයෙන් සපයනු ලබන සීනි ප්‍රමාණය කොපමණ වේ ද?

(1) ඒකක 40 (2) ඒකක 60 (3) ඒකක 80 (4) ඒකක 100 (5) ඒකක 140 (……)

**15.** පෙට්‍රල් සඳහා පවත්නා ඉල්ලුම අතිශයින් අනම්‍ය බවත් එහි සැපයුම අතිශයින් නම්‍ය බවත් සලකන්න. මෙම තත්ත්වය යටතේ පෙට්‍රල් මත නිෂ්පාදන බද්දක් පනවනු ලැබුවහොත් බදු බර

(1) ඉතා විශාල වශයෙන් ගැනුම්කරුවන් විසින් දරනු ලැබේ.
(2) ඉතා විශාල වශයෙන් විකුණුම්කරුවන් විසින් දරනු ලැබේ.
(3) ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විසින් සමසමව දරනු ලැබේ.
(4) මුළුමනින් ම අය බදු ගෙවන්නෝ දරති.
(5) ගැනුම්කරුවෝ හෝ විකුණුම්කරුවෝ හෝ නොදරති. (……)

**16.** කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා පවත්නා තරගකාරී වෙළෙඳපොළක, ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර මෙම ප්‍රස්තාර සටහන පෙන්නුම් කරයි.




මෙම භාණ්ඩයේ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවශ්‍යතාව නිසා, නිමැවුම් ඒකකයකට රු. 2ක් වන සේ සහනාධාරයක් නිෂ්පාදකයන්ට ලබාදීමට රජය තීරණය කරයි. සහනාධාරය ලබාදුන් පසුව පාරිභෝගික අතිරික්තයේ ප්‍රමාණය

(1) රු. 20කි. (2) රු. 80කි. (3) රු. 90කි. (4) රු. 160කි. (5) රු. 180කි. (......)

17. සමතුලිත මිලට වඩා පහළ මිලක් නියම කරමින් පනවනු ලබන උපරිම මිල ප්‍රතිපත්තියක ප්‍රතිඵලයක් වනුයේ වෙළෙඳපොළෙහි, කුෂාන් වීරහැන්නැදිගේ

(1) අධි සැපයුමක් හටගැනීම ය. (2) අධි ඉල්ලුමක් හටගැනීම ය.

(3) සමතුලිත මිලක් ඇතිවීම ය. (4) සැපයුම වැඩි වීම ය.

(5) ඉල්ලුම අඩු වීම ය. (......)

කුෂාන් වීරහැන්නැදිගේ

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

7. X භාණ්ඩය බාල භාණ්ඩයක් බවත්, තරගකාරී වෙළෙඳපොළක අලෙවි කරනු ලබන බවත් සලකන්න. X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළෙහි අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී, ගැනුම්කරුවන්ගේ ආදායමේ පහළ බැසීමක් නිසා වෙළෙඳපොළ ඉල්ලුම, සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය මත කෙබඳු බලපෑමක් ඇති වේ ද?

| | ඉල්ලුම | මිල | ප්‍රමාණය |
|---|---|---|---|
| (1) | අඩු වේ. | අඩු වේ. | අඩු වේ. |
| (2) | වැඩි වේ. | වැඩි වේ. | වැඩි වේ. |
| (3) | අඩු වේ. | වැඩි වේ. | අඩු වේ. |
| (4) | වැඩි වේ. | අඩු වේ. | අඩු වේ. |
| (5) | අඩු වේ. | වැඩි වේ. | වැඩි වේ. |

(......)

(......)

8. කිසියම් අත්‍යවශ්‍ය භාණ්ඩයක් මත විශේෂිත බද්දක් (ඒකක බද්දක්) පනවනු ලබන අතර, එම භාණ්ඩයේ වෙළෙඳපොළ ඉල්ලුම් ලේඛනයත්, බද්දට පෙර හා බද්දට පසු සැපයුම් ලේඛනයත් පහත දැක්වෙන වගුව පෙන්නුම් කරයි.

| මිල (රු.) | ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය | බද්දට පෙර සැපයුම් ප්‍රමාණය | බද්දට පසු සැපයුම් ප්‍රමාණය |
|---|---|---|---|
| 12 | 50 | 20 | 0 |
| 13 | 50 | 30 | 10 |
| 14 | 50 | 40 | 20 |
| 15 | 50 | 50 | 30 |
| 16 | 50 | 60 | 40 |

භාණ්ඩ ඒකකයක් සඳහා අය කරනු ලැබූ බද්දේ ප්‍රමාණය කොපමණ ද?

(1) රුපි. 2 (2) රුපි. 3 (3) රුපි. 4 (4) රුපි. 5 (5) රුපි. 6 (......)

9. බෝල්පොයින්ට් පෑන් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාව –3.0කි. බෝල්පොයින්ට් පෑනක මිල රුපි. 25ක් වන විට පෑන් 300ක් ඉල්ලුම් කරනු ලැබේ. පෑනක මිල රුපි. 20 කට අඩුවුවහොත්, කොපමණ ප්‍රමාණයක් ඉල්ලුම් කරනු ලැබේ ද?

(1) 900 (2) 630 (3) 560 (4) 480 (5) 180 (......)

**10.** කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ සඳහා වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රය වමට විතැන් වනුයේ,

(1) තාක්ෂණය වැඩි දියුණු වන විට දී ය.

(2) යෙදවුම් මිල ගණන් පහළ වැටෙන විට දී ය.

(3) යෙදවුම් මිල ගණන් ඉහළ නගින විට දී ය.

(4) තාක්ෂණය වැඩි දියුණු වන විට හා යෙදවුම් මිල ගණන් පහළ වැටෙන විට දී ය.

(5) කර්මාන්තය තුළට සැපයුම්කරුවන් වැඩි වැඩියෙන් ප්‍රවේශ වන විට දී ය. (……)

**11.** X භාණ්ඩය සඳහා ඇති සැපයුම් වක්‍රය පහත දැක්වෙන සමීකරණයෙන් පෙන්නුම් කෙරේ.

$$Q_X = 6\,P_X$$

මෙහි $Q_X$ යනු X භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය වන අතර $P_X$ යනු X භාණ්ඩයේ මිල ය. X භාණ්ඩයේ සැපයුමේ මිල නම්‍යතාව පිළිබඳව මෙම සමීකරණයෙන් නිගමනය කළ හැක්කේ කුමක් ද? කුෂාන් වීරහැන්නැදිගේ

(1) සැපයුමේ මිල නම්‍යතාව 6.0 කි.

(2) සැපයුමේ මිල නම්‍යතාව 1.0 කි.


(3) සැපයුමේ මිල නම්‍යතාව 0.1 කි.

(4) සැපයුමේ මිල නම්‍යතාව 0.0 කි.

(5) සැපයුමේ මිල නම්‍යතාව 0.6 කි. (……)

කුෂාන් වීරහැන්නැදිගේ

12. X භාණ්ඩය මත පනවා තිබූ විශේෂිත බද්දක් ඉවත් කළ පසුව, සැපයුම $S_2$ සිට $S_1$ දක්වා වැඩි වන බව පහත සඳහන් රූප සටහන පෙන්වයි. $S_1$ සැපයුම් වක්‍රය, බද්ද පැනවීමට පෙර තිබූ සැපයුම් වක්‍රය සේම බද්ද ඉවත් කළ පසු දක්නට ඇති සැපයුම් වක්‍රය ද වේ.




බද්ද ඉවත් කිරීම, බදු අයභාරය සහ පාරිභෝගික වියදම මත කෙබඳු බලපෑමක් ඇති කරනු ලැබේ ද?

| | බදු අයභාරය | පාරිභෝගික වියදම |
|---|---|---|
| (1) | 1 440 කින් අඩු වේ. | 2 000 කින් වැඩි වේ. |
| (2) | 480 කින් අඩු වේ. | 560 කින් අඩු වේ. |
| (3) | 480 කින් අඩු වේ. | 560 කින් වැඩි වේ. |
| (4) | 960 කින් වැඩි වේ. | 1 440 කින් වැඩි වේ. |
| (5) | 1 440 කින් අඩු වේ. | 960 කින් අඩු වේ. |


කුෂාන් වීරහැන්නැදිගේ

(......)

13. ආදේශන ප්‍රතිවිපාකය යනු පහත සඳහන් කරුණක ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ හටගන්නා වෙනස්වීම ය. එනම්,

(1) අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී සාපේක්ෂ මිල වෙනස් වීමකි.
(2) මූර්ත ආදායම නොවෙනස්ව තිබිය දී නිරපේක්ෂ මිල වෙනස් වීමකි.
(3) මුදල් ආදායම නොවෙනස්ව තිබිය දී සාපේක්ෂ මිල වෙනස් වීමකි.
(4) සාපේක්ෂ මිල නොවෙනස්ව තිබිය දී මූර්ත ආදායම වෙනස් වීමකි.
(5) සාපේක්ෂ මිල නොවෙනස්ව තිබිය දී මුදල් ආදායම වෙනස් වීමකි. (……)


14. කිසියම් රටක් විසින් ආනයනය කරනු ලබන පරිභෝජන භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් වක්‍රය මෙම රූපසටහන පෙන්නුම් කරයි. එම භාණ්ඩය මත ඒකකයකට $P_1 - P_2$ ප්‍රමාණයේ ආනයන බද්දක් රජය විසින් පනවනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් හටගන්නා පාරිභෝගික අතිරික්තයේ අඩු වීම හා ආණ්ඩුවේ අයභාරයේ වැඩි වීම මැනෙනුයේ රූප සටහනේ කවර ප්‍රදේශයකින් ද?




| | පාරිභෝගික අතිරික්තය අඩු වීම | ආණ්ඩුවේ අයභාරය වැඩි වීම |
|---|---|---|
| (1) | A + B | B + C |
| (2) | A + B + C | B |
| (3) | A + B | B + C + D + E |
| (4) | D | B + D |
| (5) | B + C | B |

(......)

15. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.




මෙම භාණ්ඩයේ සැපයුම පූර්ණ නම්‍ය බවත් ආරම්භයේ දී එහි මිල $P_1$ වශයෙන් පැවති බවත් සලකන්න. එම භාණ්ඩය මත බද්දක් පැනවීම නිසා, මිල $P_1$ සිට $P_2$ දක්වා වැඩි වූයේ නම්, බද්ද නිසා හට ගන්නා අධි බදු බර කොපමණ වේ ද?

(1) $P_3 A P_4$ ප්‍රදේශය (2) A D B ප්‍රදේශය (3) $P_1$ $P_4$ C ප්‍රදේශය

(4) $P_1$ C B $P_2$ ප්‍රදේශය (5) B F C ප්‍රදේශය (......)

කුෂාන් වීරහැන්නැදිගේ

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ட்
# General Certificate of Education (Adv. Level) Examination, August 2017

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

**21 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

7. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය නොවෙනස්ව පවතිනුයේ පහත සඳහන් කවර කරුණක් වෙනස් වූ විට දී ද?

(1) ජනගහනය
(2) එම භාණ්ඩයේ මිල
(3) ආදේශක භාණ්ඩයක මිල
(4) අනුපූරක භාණ්ඩයක මිල
(5) කුටුම්බවල සාමාන්‍ය ආදායම (......)

8. පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක් සහිත සාමාන්‍ය භාණ්ඩයක් සඳහා ආදායම් හා මිල ඉල්ලුම් නම්‍යතාවන්ගේ පහත සඳහන් කවර සංයෝජනයක් අනුකූල වේ ද?

| | ආදායම් ඉල්ලුම් නම්‍යතාව | මිල ඉල්ලුම් නම්‍යතාව |
|---|---|---|
| (1) | සෘණ | ධන |
| (2) | ධන | සෘණ |
| (3) | සෘණ | සෘණ |
| (4) | ධන | ධන |
| (5) | සෘණ | ශූන්‍ය |

(......)

9. A සහ B වශයෙන් භාණ්ඩ දෙකක් පමණක් ඇති බවත්, පාරිභෝගිකයාගේ මුදල් ආදායම ඇතුළු අනෙකුත් සියලු කරුණු නොවෙනස්ව පවතින බවත් සිතන්න. A භාණ්ඩයේ මිල පහළ බසින විට, B භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම වැඩි වේ නම්, අපට නිගමනය කළ හැක්කේ

(1) A සාමාන්‍ය භාණ්ඩයක් බව ය.
(2) A හා B යන භාණ්ඩ දෙක ම සාමාන්‍ය භාණ්ඩ බව ය.
(3) A බාල භාණ්ඩයක් බව ය.
(4) B බාල භාණ්ඩයක් බව ය.
(5) B සාමාන්‍ය භාණ්ඩයක් බව ය. (......)

10. සහල් මිල ඉහළ යාමක් නිසා පාන් සඳහා ඉල්ලුම 30%කින් වැඩි වේ. සහල් සහ පාන් අතර හරස් ඉල්ලුම් නම්‍යතාව 3.0 කි. මෙම තත්ත්වය ඇතිවීම සඳහා සහල් මිල කොපමණ ප්‍රමාණයකින් වෙනස් විය යුතු ද?

(1) කිලෝග්‍රෑමයක් රුපියල් 80 සිට රුපියල් 90 දක්වා
(2) කිලෝග්‍රෑමයක් රුපියල් 60 සිට රුපියල් 72 දක්වා
(3) කිලෝග්‍රෑමයක් රුපියල් 80 සිට රුපියල් 85 දක්වා
(4) කිලෝග්‍රෑමයක් රුපියල් 70 සිට රුපියල් 80 දක්වා
(5) කිලෝග්‍රෑමයක් රුපියල් 80 සිට රුපියල් 88 දක්වා (......)

කුෂාන් වීරහැන්නැදිගේ

**11.** කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළක පවත්නා මිලේ දී, පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට කැමති ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් අලෙවි කිරීමට නිෂ්පාදකයන් නිරන්තරයෙන්ම කැමැත්තෙන් සිටී නම්, එම වෙළෙඳපොළ පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?

(1) ඉල්ලුම ඉතා අනම්‍ය වේ. කුෂාන් වීරහැන්නැදිගේ

(2) සැපයුම ඉතා නම්‍ය වේ.

(3) භාණ්ඩය බාල භාණ්ඩයකි.

(4) භාණ්ඩය සඳහා උපරිම මිලක් නියම කොට තිබේ.

(5) භාණ්ඩය සඳහා අවම මිලක් නියම කොට තිබේ. (......)

**12.** කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා වන වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් සමීකරණවලින් නිරූපණය කෙරේ.

ඉල්ලුම $(Q_D) = 80 - 2P$      සැපයුම $(Q_S) = -20 + 3P$

එවිට වෙළෙඳපොළේ සමතුලිත ප්‍රමාණය සහ මිල වනුයේ

(1) ඒකක 40 සහ රුපියල් 20 කි.

(2) ඒකක 56 සහ රුපියල් 12 කි.


(3) ඒකක 50 සහ රුපියල් 15 කි.

(4) ඒකක 60 සහ රුපියල් 10 කි.

(5) ඒකක 40 සහ රුපියල් 120 කි. (......)

කුෂාන් වීරහැන්නැදිගේ

**13.** පහත දැක්වෙන රූපසටහන මගින් කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා ඇති තරගකාරී වෙළෙඳපොළක් නිරූපණය කරයි.




රජය විසින් මෙම වෙළෙඳපොළේ අලෙවි වන භාණ්ඩය මත විශේෂිත බද්දක් (ඒකක බද්දක්) පනවනු ලැබුවහොත්, බද්දට පසු නිෂ්පාදක අතිරික්තයේ ප්‍රමාණය වනුයේ,

(1) A + B + F
(2) B + E + C + F + D
(3) C + F + D
(4) D
(5) E + F + H

(......)

**14.** සැපයුමේ මිල නම්‍යතාව එකට වඩා අඩු නම්, ඉන් අදහස් වනුයේ
(1) සපයන ලද ප්‍රමාණයේ වෙනස්වීම, මිල වෙනස් වූ ප්‍රමාණයට වඩා වැඩි බව ය.
(2) සපයන ලද ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස, මිල වෙනස් වූ ප්‍රතිශතයට වඩා වැඩි බව ය.
(3) සපයන ලද ප්‍රමාණයේ වෙනස්වීම, මිල වෙනස් වූ ප්‍රමාණයට වඩා අඩු බව ය.
(4) සපයන ලද ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස, මිල වෙනස් වූ ප්‍රතිශතයට වඩා අඩු බව ය.
(5) සපයන ලද ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස, මිල වෙනස් වූ ප්‍රමාණයට වඩා අඩු බව ය. (......)

**15.** තරගකාරී වෙළෙඳපොළක ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත දැක්වෙන සමීකරණවලින් නිරූපණය කෙරේ යැයි සලකන්න.

ඉල්ලුම $(Q_D) = 60 - 2P$ සැපයුම $(Q_S) = -20 + 3P$

මෙම සමීකරණයන්ගේ $Q_D$ හා $Q_S$ යනු ඉල්ලුම් කරනු ලබන හා සපයනු ලබන ප්‍රමාණ බවත්, P යනු මිල බවත් සලකන්න. තව ද ආණ්ඩුව මෙම භාණ්ඩයේ ඒකකයක් සඳහා රුපියල් 20ක අවම මිලක් නියම කරනු ලැබේ යැයි සලකන්න. එවිට
(1) වෙළෙඳපොළෙහි ඒකක 20ක අධි සැපයුමක් හට ගනී.
(2) වෙළෙඳපොළෙහි ඒකක 28ක අධි සැපයුමක් හට ගනී.
(3) වෙළෙඳපොළෙහි ඒකක 28ක අධි ඉල්ලුමක් හට ගනී.
(4) වෙළෙඳපොළෙහි ඒකක 20ක අධි ඉල්ලුමක් හට ගනී.
(5) වෙළෙඳපොළ මත කිසිදු බලපෑමක් හට නොගනී. (......)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
# General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.06 / 1300 - 1500

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

7. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී X භාණ්ඩයෙහි මිල පහළ බසී නම්, X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළෙහි සිදුවීමට බොහෝසෙයින් ඉඩකඩ ඇත්තේ පහත සඳහන් කවරක් ද?

(1) X භාණ්ඩයෙහි සැපයුම අඩු වන්නේ ය.
(2) X භාණ්ඩය සඳහා ඉල්ලුම වැඩි වන්නේ ය.
(3) X භාණ්ඩය සඳහා ඉල්ලුම අඩු වන්නේ ය.
(4) X භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වන්නේ ය.
(5) X භාණ්ඩය සැපයුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වන්නේ ය. (......)

8. ඉල්ලුම් වක්‍රයක් ඇඳීමේදී පදනම් කරගනු ලබන උපකල්පනය වන්නේ,

(1) මිල අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සැමවිටම වැඩි වන්නේය යන්න ය.
(2) මිල අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සැමවිටම අඩු වන්නේය යන්න ය.
(3) මිලෙහි හටගන්නා වෙනස්කම්, සැපයුම කෙරෙහි බලපාන්නේ නැතැයි යන්න ය.
(4) ඉල්ලුමෙහි මිල නම්‍යතාව, ඉල්ලුම් වක්‍රය දිගේ වෙනස් නොවේය යන්න ය.
(5) මිල හැර ඉල්ලුම කෙරෙහි බලපාන සාධක ස්ථාවරව පවතීය යන්න ය. (......)

**9.** කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළක සපයනු ලබන ප්‍රමාණය $(Q_S)$ හා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය $(Q_D)$ පිළිවෙළින් $Q_S = -30 + P$ සහ $Q_D = 240 - 2P$ වශයෙන් දැක්වෙන අතර, P වලින් දැක්වෙන්නේ ඒකකයක මිල රුපියල්වලිනි. එම භාණ්ඩය මත පනවනු ලබන නිෂ්පාදන බද්දක වෙනස්වීමක් නිසා, සැපයුම $Q_S = -36 + P$ ස්වරූපය ගනී. බද්දේ හටගත් මෙම වෙනස සමතුලිත මිල කෙරෙහි බලපානුයේ කෙසේ ද?

(1) රුපියල් 2 කින් පහළ බසී. (2) රුපියල් 6 කින් පහළ බසී.
(3) රුපියල් 2 කින් ඉහළ නගී. (4) රුපියල් 6 කින් ඉහළ නගී.
(5) රුපියල් 90 කින් ඉහළ නගී. (......)

**10.** තේ සඳහා ඉල්ලුමත් සැපයුමත් දෙකම එකවර වැඩි වන්නේ නම්, තේ වෙළෙඳපොළෙහි සමතුලිත මිල හා ප්‍රමාණය කෙරෙහි එය කෙසේ බලපානු ලැබේ ද?

| | මිල | ප්‍රමාණය |
|---|---|---|
| (1) | වැඩි වේ. | වැඩි වේ. |
| (2) | අඩු වේ. | අඩු වේ. |
| (3) | අඩු වේ. | වැඩි වේ. |
| (4) | වැඩි වේ. | අවිනිශ්චිත ය. |
| (5) | අවිනිශ්චිත ය. | වැඩි වේ. |

කුෂාන් වීරහැන්නැදිගේ

11. කිසියම් පුද්ගලයෙකුගේ ආදායම ඉහළ යන විට, කිරි සඳහා ඔහුගේ ඉල්ලුම වැඩි වේ නම්, කිරි උදාහරණයක් ලෙස ගත හැක්කේ,

(1) බාල භාණ්ඩයකට ය.
(2) නොමිල භාණ්ඩයකට ය.
(3) සාමාන්‍ය භාණ්ඩයකට ය.
(4) ශුභ සාධන භාණ්ඩයකට ය.
(5) ගිෆන් භාණ්ඩයකට ය.

(......)

කුෂාන් වීරහැන්නැදිගේ

**12.** කිසියම් ආයතනයක් නිපදවනු ලබන භාණ්ඩයක් සඳහා පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතී යැයි උපකල්පනය කරන්න. ආයතනය එම භාණ්ඩයේ මිල 6% කින් ඉහළ නංවනු ලැබුවහොත්, ආයතනයේ අයභාරය මත කෙබඳු බලපෑමක් ඇති වේ ද?

(1) අයභාරය නොවෙනස්ව පවතිනු ඇත.
(2) අයභාරය 6% කින් ඉහළ නගිනු ඇත.
(3) අයභාරය 6% කින් පහළ බසිනු ඇත.
(4) අයභාරය ශුන්‍ය කරා පහළ බසිනු ඇත.
(5) අයභාරය 6% කට වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ නගිනු ඇත. (......)

**13.** 2016 වර්ෂයේදී තරගකාරී වෙළෙඳපොළක, කුරුඳු කිලෝග්‍රෑම් එකක් රුපියල් 900 බැගින් කිලෝග්‍රෑම් මිලියන 10ක් අලෙවි කරන ලදී. 2017 වර්ෂයේදී, එම වෙළෙඳපොළෙහි, කිලෝග්‍රෑම් එකක් රුපියල් 800ක් බැගින් කුරුඳු කිලෝග්‍රෑම් මිලියන 10ක් අලෙවි කරන ලදී. කුරුඳු ඉල්ලුමේ සහ සැපයුමේ පහත සඳහන් කෙබඳු වෙනස්කම්, මෙම ප්‍රතිඵලය ඇති කිරීමට හේතු වූයේ ද?

| | ඉල්ලුම | සැපයුම |
|---|---|---|
| (1) | වැඩි වීම | වැඩි වීම |
| (2) | අඩු වීම | අඩු වීම |
| (3) | අඩු වීම | වැඩි වීම |
| (4) | වැඩි වීම | අඩු වීම |
| (5) | අඩු වීම | නොවෙනස්ව තිබීම |

කුෂාන් වීරහැන්නැදිගේ

(......)

**14.** එක්තරා පාරිභෝගික භාණ්ඩයක් සඳහා වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන බවත්, වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වන බවත් සලකන්න. මෙම භාණ්ඩය සඳහා ඒකක සහනාධාරයක් ලබා දීම, පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය කෙරෙහි කෙසේ බලපෑනු ලබන්නේ ද?

| | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදක අතිරික්තය |
|---|---|---|
| (1) | අඩු වේ. | අඩු වේ. |
| (2) | අඩු වේ. | වැඩි වේ. |
| (3) | වැඩි වේ. | වැඩි වේ. |
| (4) | වැඩි වේ. | අඩු වේ. |
| (5) | වැඩි වේ. | නොවෙනස්ව පවතී. |

(……)

**15.** තරගකාරී වෙළෙඳපොළක අලෙවි කෙරෙන භාණ්ඩයකට අදාළ වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර, පහත සඳහන් සමීකරණයන්ගෙන් නිරූපණය වේ යැයි සලකන්න.

$$Q_D = 160 - 4P \qquad Q_S = -20 + 2P$$

වෙළෙඳපොළ සමතුලිත වන විට මිල ඉල්ලුම් නම්‍යතාවය

(1) −2.4 කි. (2) −2.6 කි. (3) −2.8 කි. (4) −3.0 කි. (5) −5.3 කි. (……)

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
# General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 1300 - 1500

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

5. X භාණ්ඩයේ මිල වෙනස් වීමක ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක පහත වගුව පෙන්නුම් කරයි. ආදේශන හා ආදායම් ප්‍රතිවිපාකවල නිවැරදි සංයෝජනය නිරූපණය කරනුයේ පහත සඳහන් කවරක් ද?

| | X භාණ්ඩයේ ස්වරූපය | මිල වෙනස්වීම | ආදේශන ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය | ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය |
|---|---|---|---|---|
| (1) | බාල | පහළ යයි | අඩු වේ | වැඩි වේ |
| (2) | බාල | ඉහළ යයි | අඩු වේ | අඩු වේ |
| (3) | බාල | ඉහළ යයි | වැඩි වේ | වැඩි වේ |
| (4) | සාමාන්‍ය | පහළ යයි | වැඩි වේ | වැඩි වේ |
| (5) | සාමාන්‍ය | ඉහළ යයි | වැඩි වේ | අඩු වේ |


6. භාණ්ඩයක සැපයුම් වක්‍රය වමට විතැන් කරනුයේ පහත සඳහන් කවරක් ද?

(1) නිෂ්පාදන පිරිවැයෙහි ඉහළ යාමක්
(2) නිෂ්පාදන පිරිවැයෙහි පහළ යාමක්
(3) භාණ්ඩයේ මිල ඉහළ යාමක්
(4) භාණ්ඩයේ මිල පහළ යාමක්
(5) ඉල්ලුම අඩු වීමක්

7. කිසියම් පුද්ගලයෙකුගේ ආදායම වැඩි වන විට, පොදු ප්‍රවාහන සේවය සඳහා ඔහුගේ ඉල්ලුම අඩු වන්නේ නම්, පොදු ප්‍රවාහන සේවය උදාහරණයක් වනුයේ,

(1) බාල භාණ්ඩයකට ය.
(2) නොමිල භාණ්ඩයකට ය.
(3) ගිෆන් භාණ්ඩයකට ය.
(4) සාමාන්‍ය භාණ්ඩයකට ය.
(5) පොදු භාණ්ඩයකට ය.

8. X නමැති භාණ්ඩය සඳහා වන වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහත රූපසටහන පෙන්නුම් කරයි.




වෙළෙඳපොළ සමතුලිත ප්‍රමාණය A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය කරා වෙනස් වීමට බොහෝ දුරට හේතු විය හැක්කේ

(1) ආදේශක භාණ්ඩයක මිල ඉහළ යාම ය.

(2) පාරිභෝගිකයන්ගේ ආදායම් ඉහළ යාම ය.

(3) පාරිභෝගිකයන්ගේ ආදායම් පහළ යාම ය.


(4) X භාණ්ඩයේ නිෂ්පාදන පිරිවැය පහළ යාම ය.

(5) X භාණ්ඩයේ සැපයුම අඩු වීම ය.

**9.** භාණ්ඩ ඒකකයක් සඳහා රු. 100ක සමතුලිත මිලක් පවතින කල්පිත තරගකාරී වෙළෙඳපොළක් උපකල්පනය කරන්න. දැන් වෙළෙඳපොළ සැපයුම් වක්‍රය සෑම මිලකදී ම නම්‍ය තත්ත්වයක සිට, සෑම මිලක දී ම අනම්‍ය තත්ත්වයක් කරා වෙනස්වන බවත්, එහිදී වෙළෙඳපොළ සමතුලිත මිල නොවෙනස්ව පවතින බවත් සලකන්න. මෙම වෙනස පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය මත ඇති කරන ප්‍රතිවිපාක කවරේ ද?

| | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදක අතිරික්තය |
|---|---|---|
| (1) | වැඩි වේ | අඩු වේ |
| (2) | වැඩි වේ | නොවෙනස් වේ |
| (3) | නොවෙනස් වේ | වැඩි වේ |
| (4) | නොවෙනස් වේ | නොවෙනස් වේ |
| (5) | අඩු වේ | වැඩි වේ |

**10.** සාමාන්‍ය භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත රූපසටහන පෙන්නුම් කරයි.




වෙළෙඳපොළ සමතුලිත මිල $P_1$ සිට $P_2$ දක්වා ඉහළ යා හැක්කේ

(1) පාරිභෝගිකයන්ගේ ආදායම් ඉහළ ගිය විට ය.


(2) අනුපූරක භාණ්ඩයක මිල ඉහළ ගිය විට ය.

(3) නිෂ්පාදන පිරිවැය සැලකිය යුතු ලෙස පහළ වැටුණ විට ය.

(4) නිෂ්පාදිතය මත ලබාදෙන සහනාධාර ඉහළ ගිය විට ය.

(5) $P_2$ මිල උපරිම මිලක් වශයෙන් නෛතිකව නියම කළ විට ය.

11. පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයක්, එහි සිසුනට අන්තර්ජාල සේවාව ආරම්භයේ දී ගාස්තු අය කිරීමකින් තොරව ලබා දෙනු ලැබුවේ යැයි උපකල්පනය කරන්න. පසුව අන්තර්ජාල සේවාව භාවිත කරන අයගෙන් පැයකට රුපියල් 100ක් බැගින් ගාස්තුවක් අය කිරීමට ආයතනය තීරණය කළ අතර අන්තර්ජාල සේවාව සඳහා සිසුන්ගේ ඉල්ලුම් වක්‍රය පහත රූපසටහනෙහි දැක්වේ.




ගාස්තු අයකිරීම හඳුන්වා දුන් පසුව අහිමි වූ පාරිභෝගික අතිරික්තයේ වටිනාකම

(1) රුපියල් 90 000කි.
(2) රුපියල් 45 000කි.
(3) රුපියල් 40 000කි.
(4) රුපියල් 10 000කි.
(5) රුපියල් 5 000කි.

කුෂාන් වීරහැන්නැදිගේ


12. නිෂ්පාදනය මත ඒකක බද්දක් පැනවීමට පෙර සහ පසු කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා වූ ඉල්ලුම් හා සැපයුම් ලේඛන පහත වගුව පෙන්වයි.

| මිල (රු.) | ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය | බද්දට පෙර සැපයූ ප්‍රමාණය | බද්දට පසු සැපයූ ප්‍රමාණය |
|---|---|---|---|
| 65 | 650 | 550 | 450 |
| 70 | 650 | 600 | 500 |
| 75 | 650 | 650 | 550 |
| 80 | 650 | 700 | 600 |
| 85 | 650 | 750 | 650 |
| 90 | 650 | 800 | 700 |
| 100 | 650 | 850 | 750 |

ඒකක බද්දේ ප්‍රමාණය සහ බද්දට පසු මිල වෙනස් වූ ප්‍රමාණය කොපමණ ද?

(1) බද්ද රුපියල් 10ක් සහ මිල වෙනස රුපියල් 5කි.
(2) බද්ද රුපියල් 10ක් සහ මිල වෙනස රුපියල් 10කි.
(3) බද්ද රුපියල් 50ක් සහ මිල වෙනස රුපියල් 75කි.
(4) බද්ද රුපියල් 50ක් සහ මිල වෙනස රුපියල් 85කි.
(5) බද්ද රුපියල් 10ක් සහ මිල වෙනස රුපියල් 80කි.

13. කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා පවතින තරගකාරී වෙළෙඳපොළක් පහත රූපසටහන පෙන්නුම් කරයි.




රජය මෙම භාණ්ඩයේ නිෂ්පාදකයින්ට ඒකක සහනාධාරයක් ලබා දේ නම්, නිෂ්පාදකයන් සහ පාරිභෝගිකයන් අතර ආර්ථික අතිරික්තය කෙසේ බෙදීයනු ලැබේ ද?

(1) ආර්ථික අතිරික්තයෙන් වැඩි කොටසක් පාරිභෝගිකයන් වෙත යයි.

(2) ආර්ථික අතිරික්තයෙන් වැඩි කොටසක් නිෂ්පාදකයන් වෙත යයි.

(3) ආර්ථික අතිරික්තය මුළුමනින් ම නිෂ්පාදකයන් වෙත යයි.

(4) ආර්ථික අතිරික්තය මුළුමනින් ම පාරිභෝගිකයන් වෙත යයි.

(5) ආර්ථික අතිරික්තය පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන් අතර සම සමව බෙදී යනු ඇත.

කුෂාන් වීරහැන්නැදිගේ

**14.** සළු අවම මිලක් නියම කළ විට

(1) පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය වැඩි වේ.

(2) පාරිභෝගික අතිරික්තය වැඩි වන අතර නිෂ්පාදක අතිරික්තය අඩු වේ.

(3) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය අඩු වේ.

(4) පාරිභෝගික අතිරික්තය අඩු වන අතර නිෂ්පාදක අතිරික්තය වැඩි වේ.

(5) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය යන දෙකම නොවෙනස්ව පවතී.

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
# General Certificate of Education (Adv. Level) Examination, 2020

**ආර්ථික විද්‍යාව I**
**பொருளியல் I**
**Economics I**

**21 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

5. ඉල්ලුම් නීතිය මගින් ප්‍රකාශ කෙරෙනුයේ,

(1) භාණ්ඩයක මිල අඩුවීමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය වමට විතැන් කරන බව ය.

(2) අතිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී කිසියම් භාණ්ඩයක මිල ඉහළ යත්ම, එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය පහළ යන බව ය.

(3) අතිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී කිසියම් භාණ්ඩයක මිල ඉහළ යත්ම, එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඉහළ යන බව ය.

(4) භාණ්ඩයක මිල අඩුවීමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් කරන බව ය.

(5) භාණ්ඩයක මිල ඉහළ යාමක් එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය වමට විතැන් කරන බව ය.

6. කිසියම් භාණ්ඩයක් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය,

(1) යම්කිසි මිලක දී පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට සැලසුම් කරනු ලබන ප්‍රමාණයයි.

(2) එම භාණ්ඩයේ මිලෙන් සහ පාරිභෝගියාගේ ආදායම් මට්ටමෙන් ස්වාධීන වූවකි.

(3) පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීමේ සැලසුම්වලින් ස්වාධීන වූවකි.

(4) සැමවිටම සමතුලිත ප්‍රමාණයට සමාන වේ.

(5) විවිධ මිලයන්හි දී පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට කැමති ප්‍රමාණයන් ය.

7. X භාණ්ඩයෙහි සැපයුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වීමට පහත සඳහන් කවරක් හේතු වේ ද?

(1) අනිකුත් කරුණු නොවෙනස්ව තිබිය දී X භාණ්ඩයෙහි මිල ඉහළ යාමක්

(2) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ දී අනුපූරක භාණ්ඩයක් ලෙස ක්‍රියා කරන Y භාණ්ඩයෙහි මිල ඉහළ යාමක්

(3) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමට භාවිත කෙරෙන තාක්ෂණයේ වැඩි දියුණු වීමක්

(4) X භාණ්ඩය නිෂ්පාදනය කිරීමට භාවිත කෙරෙන සම්පත්වල මිල පහළ බැසීමක්

(5) X භාණ්ඩය සඳහා වන ආදේශක භාණ්ඩයක ඉල්ලුමෙහි අඩු වීමක්

**8.** තරගකාරී වෙළෙඳපොළක ඉල්ලුම සහ සැපයුම යන දෙකම වැඩි වුවහොත්, සමතුලිත මිල සහ ප්‍රමාණය මත කෙබඳු බලපෑමක් හටගනී ද? කුෂාන් වීරහැන්නැදිගේ

(1) නිශ්චිත වශයෙන්ම මිල ඉහළ යන නමුදු ප්‍රමාණය වැඩි වීමට හෝ අඩු වීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.

(2) නිශ්චිත වශයෙන්ම ප්‍රමාණය ඉහළ යන නමුදු, මිල ඉහළ නැඟීමට හෝ පහළ බැසීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.

(3) නිශ්චිත වශයෙන්ම ප්‍රමාණය පහළ යන නමුදු, මිල ඉහළ නැඟීමට හෝ පහළ බැසීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.

(4) නිශ්චිත වශයෙන්ම මිල පහළ යන නමුදු, ප්‍රමාණය වැඩිවීමට හෝ අඩු වීමට හෝ නොවෙනස්ව තිබීමට හෝ පිළිවන.

(5) නිශ්චිත වශයෙන්ම මිල හා ප්‍රමාණය යන දෙකම ඉහළ නගී.

**9.** එක්තරා පාරිභෝගික භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය $Q_D = 500 - 5P$ යයි සලකන්න. රුපියල් 20ත් රුපියල් 30ත් අතර මිල පරාසයේ දී මෙම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුමෙහි චාප මිල නම්‍යතාව කොපමණ වේ ද?

(1) $-0.25$ (2) $-0.33$ (3) $-0.43$ (4) $-0.52$ (5) $-0.66$

කුෂාන් වීරහැන්නැදිගේ

10. කිසියම් රටක ජාතික ආපදාවක් පවතින අවස්ථාවක, එරට එළවළු ගොවීහු තම ත්‍යාගශීලිත්වය පෙන්නුම් කරමින් පාරිභෝගිකයන්ට අවශ්‍යතරම් එළවළු, තරඟකාරී සමතුලිත වෙළෙඳපොළ මිලෙන් හරි අඩකට අලෙවි කිරීමට තීරණය කරති. මෙම ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන්

(1) ආර්ථික අතිරික්තය පහළ වැටෙනු ඇත.
(2) ආර්ථික අතිරික්තය ඉහළ නගිනු ඇත.
(3) ආර්ථික අතිරික්තය නොවෙනස්ව පවතිනු ඇත.
(4) පාරිභෝගික අතිරික්තය පහළ වැටෙනු ඇත.
(5) නිෂ්පාදක අතිරික්තය ඉහළ නගිනු ඇත.

11. කිසියම් භාණ්ඩයක මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය ඍණ අගයක් ගනු ලැබුවත්, ආදේශන ප්‍රතිවිපාකය වඩා බලවත් වේ නම්, එම භාණ්ඩය

(1) ගිෆන් භාණ්ඩයක් වේ.
(2) සාමාන්‍ය භාණ්ඩයක් වේ.
(3) අත්‍යවශ්‍ය භාණ්ඩයක් වේ.
(4) බාල භාණ්ඩයක් වේ.
(5) සුඛෝපභෝගී භාණ්ඩයක් වේ.

කුෂාන් වීරහැන්නැදිගේ

12. කිසියම් වෙළෙඳපොළක උපරිම මිලක් පනවා ඇති විට,
(1) අඛණ්ඩ භාණ්ඩ හිඟයක් හටගනී.
(2) අඛණ්ඩ භාණ්ඩ අතිරික්තයක් හටගනී.
(3) භාණ්ඩය අලෙවිකරන්නන්ට වඩාත් වාසිදායක වේ.
(4) කිසිවෙකුටවත් වාසියක් ඇති නොවේ.
(5) ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයට වඩා සැපයුම් කරනු ලබන ප්‍රමාණය විශාල වේ.

13. ගොවිපොළ නිෂ්පාදිත මත සරල අවම මිලයන් නියම කිරීම ආශ්‍රයෙන් පැන නැගෙන ප්‍රශ්නයක් **නොවනුයේ** පහත සඳහන් කවරක් ද?
(1) බරපතළ ආකාරයේ අධි සැපයුමක් වෙළෙඳපොළෙහි හටගැනීම
(2) කෘෂිකාර්මික නොවන බදු ගෙවන්නන් වෙතින් ගොවි ජනයා වෙත ආදායම සංක්‍රාම වීම
(3) රජය විසින් විශාල සහනාධාර ප්‍රමාණයක් ලබාදීම
(4) පාරිභෝගිකයන් ගෙවන මිල ඉහළ යාම
(5) කෘෂිකාර්මික භාණ්ඩ සඳහා කළු කඩ ඇති වීම

කුෂාන් වීරහැන්නැදිගේ

**14.** තරගකාරී වෙළෙඳපොළක අලෙවි කෙරෙන භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය, $Q_D = 180 - 2P$ සමීකරණයෙන් දැක්වේ. වෙළෙඳපොළ සමතුලිත මිල රුපියල් 65ක් වේ නම්, පාරිභෝගික අතිරික්තයෙහි අගය

(1) රුපියල් 625 කි.
(2) රුපියල් 1 000 කි.
(3) රුපියල් 1 250 කි.
(4) රුපියල් 3 250 කි.
(5) රුපියල් 4 500 කි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்
# Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**5.** සහල් මිල වැඩිවන විට අපේක්ෂා කරනුයේ

(1) සහල් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ වැඩි වීමකි.

(2) සහල් සැපයුම් කරනු ලබන ප්‍රමාණයේ අඩු වීමකි.

(3) සහල් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ අඩු වීමකි.

(4) සහල් ඉල්ලුම අඩු වීමකි.

(5) සහල් සැපයුම වැඩි වීමකි.

6. ඇගලුම් නිෂ්පාදනයේ ප්‍රධාන යෙදවුමක් වන්නේ රෙදිපිළි බව සලකන්න. අනෙකුත් කරුණු නොවෙනස් ව තිබියදී, රෙදිපිළි මිල පහළ බසී නම්, එහිදී අපේක්ෂා කරනුයේ

(1) රෙදිපිළි ඉල්ලුම ඉහළ යාමකි.
(2) ඇගලුම් සැපයුම ඉහළ යාමකි.
(3) ඇගලුම් සැපයුම පහළ යාමකි.
(4) ඇගලුම් ඉල්ලුම ඉහළ යාමකි.
(5) ඇගලුම් ඉල්ලුම පහළ යාමකි.

7. X භාණ්ඩයේ සැපයුම් ශ්‍රිතය, $Q_s = 8P$ සමීකරණයෙන් දැක්වෙන අතර, එහි P භාණ්ඩයේ මිලත් $Q_s$ සැපයුම් කරනු ලබන ප්‍රමාණයත් පෙන්නුම් කරයි. මෙම සමීකරණයට අනුව X භාණ්ඩයේ සැපයුමෙහි මිල නම්‍යතාව

(1) 1.0 කි.
(2) –1.0 කි.
(3) 8.0 කි.
(4) –8.0 කි.
(5) 0.1 කි.

8. අලිගැටපේර සඳහා ඇති වෙළෙඳපොළ එකවර සිදුවීම් දෙකකට මුහුණ පා ඇතැයි සලකමු. අලිගැටපේර සැපයුමට බලපාන ඇඩි නියඟයක් පැවැතිය දී පිළිකා රෝග වළක්වා ගැනීමට උපකාරී විය හැකි ඖෂධීය ගුණ අලිගැටපේරවල අඩංගු බව පර්යේෂණයක් මගින් පෙන්වා දී තිබේ. මෙම සිදුවීම් දෙක අලිගැටපේර වෙළෙඳපොළෙහි සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය කෙරෙහි කෙසේ බලපාතු ලබන්නේ ද?

| | සමතුලිත මිල | සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| (1) | වැඩි වේ | අඩු වේ |
| (2) | වැඩි වේ | වැඩි වේ |
| (3) | අඩු වේ | අඩු වේ |
| (4) | වැඩි වේ | අවිනිශ්චිත වේ |
| (5) | අඩු වේ | අවිනිශ්චිත වේ |

9. X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළ දැනට සමතුලිතයෙහි පවතී යැයි සලකන්න. X භාණ්ඩයේ සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය යන දෙකම අඩු කිරීමට හේතු **නොවන්නේ** පහත සඳහන් කවර සිදුවීමක් ද?

(1) X භාණ්ඩය සඳහා අනුපූරක භාණ්ඩයක් වන Y භාණ්ඩයේ මිල ඉහළ යාම

(2) X භාණ්ඩය සඳහා ආදේශක භාණ්ඩයක් වන Y භාණ්ඩයේ මිල පහළ යාම

(3) X භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් වීම සහ පාරිභෝගික ආදායම් පහළ යාම

(4) X භාණ්ඩය බාල භාණ්ඩයක් වීම සහ පාරිභෝගික ආදායම ඉහළ යාම

(5) X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළෙහි ගැනුම්කරුවන් සංඛ්‍යාව ඉහළ යාම

Activate W
Go to Settin

10. එක්තරා කුඩා නගරයක පලාකොළ සඳහා ඇති දෛනික වෙළෙඳපොළ ඉල්ලුම හා සැපයුම පහත සඳහන් වගුවේ පෙන්නුම් කරයි.

| කිලෝ ග්‍රෑමයක මිල (රු.) | දෛනික ඉල්ලුම් ප්‍රමාණය (කි.ග්‍රෑ.) | දෛනික සැපයුම් ප්‍රමාණය (කි.ග්‍රෑ.) |
|---|---|---|
| 60 | 220 | 310 |
| 55 | 240 | 300 |
| 50 | 260 | 290 |
| 45 | 280 | 280 |
| 40 | 300 | 270 |

ප්‍රවාහන වියදම් ඉහළ යාම නිසා පලාකොළ සැපයුම සෑම මිලකදී ම කිලෝ ග්‍රෑම් 60කින් අඩු වේ යැයි සලකන්න. පලාකොළ සඳහා අලුත් සමතුලිත මිල කොපමණ ද?

(1) රු. 60 (2) රු. 55 (3) රු. 50 (4) රු. 45 (5) රු. 40

11. භාණ්ඩයක මිල රු. 40 සිට රු. 50 දක්වා ඉහළයාම, එම භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඒකක 1 600 සිට ඒකක 1 400 දක්වා අඩු කිරීමට හේතු වේ යැයි සලකන්න. ඉල්ලුම් වක්‍රයේ මෙම පරාසය තුළ, ඉල්ලුමේ මිල නම්‍යතාව

(1) – 6.0 කි. (2) – 3.0 කි. (3) – 0.7 කි. (4) – 0.6 කි. (5) – 0.3 කි.

**12.** කිසියම් භාණ්ඩයක් සඳහා නිදහස් වෙළෙඳපොළ සමතුලිත මිලට වඩා ඉහළ, සහතික කළ අවම මිලක් හඳුන්වාදීමේ දී රජයට දැරීමට සිදුවන පිරිවැය වඩාත් අධික වනුයේ,

(1) ඉල්ලුමත් සැපයුමත් යන දෙකම මිල නම්‍ය වේ නම් ය.


(2) ඉල්ලුමත් සැපයුමත් යන දෙකම මිල අනම්‍ය වේ නම් ය.

(3) ඉල්ලුම මිල නම්‍ය වී සැපයුම මිල අනම්‍ය වේ නම් ය.

(4) ඉල්ලුම මිල අනම්‍ය වී සැපයුම මිල නම්‍ය වේ නම් ය.

(5) ඉල්ලුමත් සැපයුමත් යන දෙකම ඒකීය මිල නම්‍යතාවකින් යුක්ත වේ නම් ය.

**13.** පහත දැක්වෙන රූපසටහන X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළ නිරූපණය කරයි. තරගකාරී වෙළෙඳපොළ සමතුලිතය E ලක්ෂ්‍යය වේ. රජය විසින් X භාණ්ඩයේ නිෂ්පාදනය මත ඒකක බද්දක් පනවනු ලැබේ යැයි සලකන්න.




බද්ද නිසා රජය උපයාගත් අයභාරය සහ අහිමි වූ සුබසාධනය ප්‍රස්තාරයේ කවර ප්‍රදේශයකින් පෙන්නුම් කෙරේ ද?

| | බදු අයභාරය | අහිමි වූ සුබසාධනය |
|---|---|---|
| (1) | P N F T | F T E |
| (2) | 0 N F $Q_3$ | K T E |
| (3) | J P T K | K F E |
| (4) | J N F K | K F E |
| (5) | J N F K | K T E |

Activate Windows
Go to Settings

**14.** තරගකාරී වෙළෙඳපොළක එක්තරා භාණ්ඩයක සමතුලිත මිල ඒකකයක් රු. 50ක් බව සලකන්න. දැන් මෙම වෙළෙඳපොළට රජය මැදිහත්ව ඒකකයක් රු. 60ක් ලෙස අවම මිලක් පනවනු ලබයි. වෙළෙඳපොළෙහි එක ගැනුම්කරුවකුගේ ඉල්ලුම් ශ්‍රිතය $Q_d = 240 - 3P$ නම් අවම මිල, එම ගැනුම්කරුවාගේ පාරිභෝගික අතිරික්තයට කරනු ලබන බලපෑම කුමක් ද?

(1) රු. 600කින් වැඩි වේ.
(2) රු. 600කින් අඩු වේ.
(3) රු. 750කින් වැඩි වේ.
(4) රු. 750කින් අඩු වේ.
(5) රු. 1 350කින් අඩු වේ.

AL/2022(2023)/21/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

**ආර්ථික විද්‍යාව I**
பொருளியல் I
Economics I

**21 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

5. පසුගිය වර්ෂයේ දී ටොන් එකක් රු. 30 000 බැගින් බඩඉරිඟු ටොන් මිලියන 15ක් අලෙවි කළ අතර, මෙම වර්ෂයේ දී බඩඉරිඟු ටොන් මිලියන 15ක් අලෙවි කරනු ලැබුවේ ටොන් එකක් රු. 25 000කට ය. මෙම ප්‍රතිඵලයට හේතු විය හැක්කේ ඉල්ලුමේ හා සැපයුමේ පහත සඳහන් කවර වෙනස්වීමක් ද? කුෂාන් වීරහැන්නැදිගේ

| | ඉල්ලුම | සැපයුම |
|---|---|---|
| (1) | වැඩිවීම | වැඩිවීම |
| (2) | වැඩිවීම | අඩුවීම |
| (3) | අඩුවීම | වැඩිවීම |
| (4) | අඩුවීම | අඩුවීම |
| (5) | වැඩිවීම | වෙනස් නොවීම |

කුෂාන් වීරහැන්නැදිගේ

6. පාරිභෝගිකයෙකු තම මුළු ආදායම X සහ Y යන භාණ්ඩ දෙක මිල දී ගැනීම සඳහා වැය කරනවා යැයි සලකන්න. අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී පාරිභෝගිකයාගේ ආදායමත් X සහ Y භාණ්ඩවල මිලත් දෙගුණ වුවහොත් මෙම පාරිභෝගිකයා

(1) X සහ Y භාණ්ඩවලින් මිල දී ගන්නා ප්‍රමාණ දෙගුණ කරයි.
(2) X භාණ්ඩය මිල දී ගන්නා ප්‍රමාණය වැඩිකොට Y භාණ්ඩයෙන් මිල දී ගන්නා ප්‍රමාණය අඩු කරයි.
(3) X භාණ්ඩය මිල දී ගන්නා ප්‍රමාණය අඩුකොට Y භාණ්ඩය මිල දී ගන්නා ප්‍රමාණය වැඩි කරයි.
(4) X සහ Y භාණ්ඩ දෙකම මිල දී ගන්නා ප්‍රමාණය අඩු කරයි.
(5) පෙරදී මිල දී ගත් X සහ Y භාණ්ඩ ප්‍රමාණය ම මිල දී ගනී.


7. බාල භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වන්නේ ඇයි ද යන්න පැහැදිලි කිරීමෙහි ලා උපකාරී වනුයේ පහත සඳහන් කවරක් ද?

(1) ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාක විසින් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය එකම දිශාවට රැගෙන යනු ලැබේ.
(2) ආදේශන ප්‍රතිවිපාකය ආදායම් ප්‍රතිවිපාකයට සමාන වේ.
(3) සෘණ ආදායම් ප්‍රතිවිපාකය විසින් ආදේශන ප්‍රතිවිපාකය අභිබවා යනු ලැබේ.
(4) ආදේශන ප්‍රතිවිපාකය විසින් සෘණ ආදායම් ප්‍රතිවිපාකය අභිබවා යනු ලැබේ.
(5) ආදායම ඉහළ යාමත් සමග පාරිභෝගිකයා විසින් භාණ්ඩය පරිභෝජනය කිරීම වැඩි කරනු ලැබේ.

8. X සහ Y භාණ්ඩ අනුපූරක භාණ්ඩ බව සලකන්න. අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී Y භාණ්ඩයේ සැපයුම වැඩිවීමක් නිසා X භාණ්ඩයේ සමතුලිත මිල සහ ප්‍රමාණය මත කවර බලපෑමක් ඇති කෙරේ ද?

| | X භාණ්ඩයේ සමතුලිත මිල | X භාණ්ඩයේ සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| (1) | අඩු වේ | අඩු වේ |
| (2) | අඩු වේ | වැඩි වේ |
| (3) | වැඩි වේ | අඩු වේ |
| (4) | වැඩි වේ | වැඩි වේ |
| (5) | අඩු වේ | නොවෙනස් වේ |

**9.** එක්තරා භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහත රූපසටහනෙහි දැක් වේ.




ඉහත රූපසටහනෙහි දැක්වෙන ඉල්ලුම් වක්‍රය රු. 8 සහ රු. 10 අතර මිලයන්හි දී

(1) පූර්ණ නම්‍ය වේ.

(2) සාපේක්ෂව නම්‍ය වේ.

(3) සාපේක්ෂව අනම්‍ය වේ.

(4) ඒකීය නම්‍ය වේ.

(5) පූර්ණ අනම්‍ය වේ.

කුෂාන් වීරහැන්නැදිගේ

10. තරගකාරී වෙළෙඳපොළක අලෙවිකරන එක්තරා භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම වක්‍ර පහත දැක්වෙන සමීකරණ මගින් නිරූපණය කෙරේ. මිල රුපියල්වලින් දැක් වේ.

ඉල්ලුම : $Q_D = 40 - 2P$  සැපයුම : $Q_S = -40 + 8P$

වෙළෙඳපොළ සමතුලිතයේ දී සමස්ත අතිරික්තය

(1) 36කි. (2) 144කි. (3) 180කි. (4) 192කි. (5) 360කි.

කුෂාන් වීරහැන්නැදිගේ

11. සහල් සහ පාන් අතර ඉල්ලුමේ හරස් මිල නම්‍යතාව 3.0ක් වේ යැයි සලකන්න. සහල් මිල ඉහළ යාමක් නිසා පාන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය 75%කින් වැඩි විය. සහල් මිලයන්හි කවර වෙනසක් මේ සඳහා හේතු වූයේ ද?

| | සහල් කිලෝග්‍රෑමයක මිල වෙනස් වීම (රු.) | |
|---|---|---|
| | සිට | දක්වා |
| (1) | 50 | 70 |
| (2) | 60 | 72 |
| (3) | 75 | 90 |
| (4) | 80 | 105 |
| (5) | 100 | 125 |

12. තිරිඟු පිටි සඳහා වෙළෙඳපොළ සමතුලිත මිල කිලෝග්‍රෑමයක් රු. 350ක් වන අතර වෙළෙඳපොළ සමතුලිත ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 30කි. මෙම තත්ත්වය යටතේ පහත සඳහන් කවර ප්‍රතිපත්තියක් වෙළෙඳපොළේ තිරිඟු පිටි සඳහා අධි ඉල්ලුම් තත්ත්වයක් ඇති කරනු ලැබේ ද?

(1) කිලෝග්‍රෑමයක් රු. 330 ලෙස උපරිම මිලක් පැනවීම

(2) කිලෝග්‍රෑමයක් රු. 330 ලෙස අවම මිලක් පැනවීම

(3) කිලෝග්‍රෑමයක් රු. 400 ලෙස උපරිම මිලක් පැනවීම

(4) කිලෝග්‍රෑමයක් රු. 350 ලෙස අවම මිලක් පැනවීම

(5) කිලෝග්‍රෑමයක් රු. 375 ලෙස උපරිම මිලක් පැනවීම

Activate
Go to Setti

**13.** පහළට බැවුම්වන ඉල්ලුම් වක්‍රයක් සහ ඉහළට බැවුම්වන සැපයුම් වක්‍රයක් සහිත භාණ්ඩයක් මත පනවනු ලබන ඒකක බද්දක් කුෂාන් වීරහැන්නැදිගේ

(1) නිෂ්පාදක අතිරික්තය ඉහළ නංවයි.


(2) පාරිභෝගික අතිරික්තය ඉහළ නංවයි.

(3) සැපයුම් වක්‍රය දකුණට විතැන් කිරීමට හේතු වේ.

(4) බද්දේ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් මිල ඉහළ නංවයි.

(5) බද්දේ ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකින් මිල ඉහළ නංවයි.

**14.**




බඩඉරිඟු සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර ඉහත රූපසටහන පෙන්නුම් කරයි. බඩඉරිඟු ගොවීන්ට උපකාර වශයෙන් සථල අවම මිලක් හඳුන්වා දීමට රජය අදහස් කරන්නේ යැයි සලකන්න. සථල අවම මිල වශයෙන් $0P_2$ පවත්වා ගෙනයාමට රජය කළ යුත්තේ කුමක් ද?

(1) $Q_1 - Q_2$ ප්‍රමාණය මිලට ගැනීම

(2) $0 - Q_2$ ප්‍රමාණය මිලට ගැනීම

(3) $Q_1 - Q_3$ ප්‍රමාණය මිලට ගැනීම

(4) $Q_2 - Q_3$ ප්‍රමාණය මිලට ගැනීම

(5) $Q_1 - Q_2$ ප්‍රමාණය අලෙවි කිරීම

කුෂාන් වීරහැන්නැදිගේ
Activate
Go to Sett

**ඉදිරි VIDEO බැලීම සඳහා SUBSCRIBE කරන්න**